# ACCOUNTING
# &
# IT'S NEED
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ගිණුම්කරණය යන්න නිර්වචනය

විවිධ ආයතන විසින් ගිණුම්කරණය යන්න පහත සඳහන් ආකාරයට නිර්වචනය කර ඇත.

## ඇමරිකානු ගිණුම්කරණ සංගමය (American Accounting Association)

"තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන්ට විනිශ්චයක් කිරීමටත්, තීරණ ගැනීමට හැකිවන අයුරින් ආර්ථික තොරතුරු හඳුනා ගැනීමේ, මැනීමේ සහ සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය" ගිණුම්කරණයයි.

## ඇමරිකානු පොදු සහතිකලත් ගණකාධිකාරී ආයතනය (American Institute of Certified Public Accountants)

"ව්‍යාපාරයක යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මූල්‍ය ස්වරූපයක් ගන්නා ගණුදෙනු හා සිද්ධි සුවිශේෂි ආකාරයට මුදල් මාධ්‍යය උපයෝගී කර ගෙන සටහන් කිරීමේ, වර්ග කිරීමේ, සාරාංශ කිරීමේ සහ ක්‍රියාවලියේ ප්‍රථිඵල විවරණය කිරීමේ කලාව" ගිණුම්කරණයයි.

පළමු නිර්වචනය ගැන අවධානය යොමු කළ හොත්, එය ගිණුම්කරණය පිළිබඳව පොදු නිර්වචනයකි. දෙවන නිර්වචනය මූල්‍ය ගිණුම්කරණය ගැන අවධාරණය කරයි.

ClassWork.LK

# "ගිණුම්කරණය" යන්නට පොදු නිර්වචනයක්

ඉහත නිර්වචන දෙක අධ්‍යයනය කිරීමෙන් පසුව "ගිණුම්කරණය" යන්නට පොදු නිර්වචනයක් ගොඩ නැගිය හැකිය.

"උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ ආර්ථික තොරතුරු සැපයීමේ සමස්ථ ක්‍රියාවලිය ගිණුම්කරණයයි.

ආර්ථික තොරතුරු, ගිණුම්කරණ ඒකකය, ගිණුම්කරණ ක්‍රියාවලිය, උනන්දුවක් දක්වන පාර්ශ්වයන් ඔවුන් ගනු ලබන තීරණ, මෙම නිර්වචනය තුළින් ලබා ගත හැකිය.

ClassWork.LK

# ගිණුම්කරණයේ අරමුණු:

"ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු, සන්නිවේදනය කිරීම" ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.

ගිණුම්කරණ ඒකකය, පුද්ගලයෙක්, රජයක්, ව්‍යාපාර සංවිධානයක්, ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කටයුත්තක් විය හැකිය. මෙහි දී ආර්ථික තොරතුරු ලෙස හඳුනා ගන්නේ **මූල්‍යමය තොරතුරු** ය.

**නිදසුන්:**

- ව්‍යාපාරයේ ගිණුම් වර්ෂයක ලාභය රු. 200 000 කි.
- ව්‍යාපාරයේ මුළු වත්කම් රු. 2 000 000 කි.
- ව්‍යාපාරයේ මුළු වගකීම් රු. 500 000 කි.

උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා වැදගත්වන **මූල්‍යමය නොවන තොරතුරු** ද ඇත.

**නිදසුන්:**

- ආයතනයේ සේවක මණ්ඩලය 500 කි.
- තත්ත්වයෙන්, ගුණයෙන් උසස් භාණ්ඩ අලෙවි කිරීම ව්‍යාපාරය ගැන මහජනයා තුළ හොඳ ප්‍රතිචාරයක් ඇත.
- සේවක අභිප්‍රේරණය සඳහා හොඳ වැඩපිළිවෙලක් ආයතනය තුළ ක්‍රියාත්මක වේ.

ClassWork.LK

# ආයතනයට ඇල්මක් දක්වන පාර්ශ්වයන්

# හා එසේ ඇල්මක් දැක්වීමට හේතු

| ඇල්මක් දක්වන පාර්ශ්ව | ඇල්මැති පාර්ශ්වවලට අවශ්‍ය වන තොරතුරු |
|---|---|
| 1. අයිතිකරු/ අයිතිකරුවන් | • ආයෝජනයට සරිලන / සතුටුදායක ප්‍රතිලාභයක් ලබා තිබේ ද? |
| 2. කළමනාකරුවන් | • සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද?<br>• අනාගත වර්ධනය සඳහා ගත යුතු තීරණ/සැලසුම් මොනවා ද? |
| 3. සේවකයෝ | • රැකියාවේ සුරක්ෂිත බවක් තිබේ ද?<br>• වැටුප් වැඩි කිරීමට ව්‍යාපාරයට හැකියාවක් තිබේ ද? |
| 4. රාජ්‍ය ආයතන නිදː දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | • නියමිත පරිදි බදු ගෙවන්නේ ද?<br>• අවශ්‍ය වාර්තා අදාළ ආයතනවලට සපයන්නේ ද?<br>• සාධාරණ මිලකට ගුණාත්වයෙන් යුතු නිෂ්පාදිත ලබා දෙන්නේ ද? |
| 5. ගනුදෙනුකරුවන් | • වගකීම් සහතික (ප්‍රතිඥාභාර) ඉටු කිරීමට ව්‍යාපාරයට හොඳ පැවැත්මක් තිබේ ද? |
| 6. ණය හිමියෝ සහ ණය සපයන ආයතන | • සපයා ඇති ණය ආපසු ලබා ගත හැකි ද?<br>• තවදුරටත් ණය සැපයීම සිදු කිරීම සුදුසු ද? |

ClassWork.LK

# ගිණුම්කරණයේ ප්‍රභේද

ගිණුම්කරණ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශ්වයන් අනුව ගිණුම්කරණය ප්‍රධාන කොටස් දෙකකි.


**ගිණුම්කරණය**

- මූල්‍ය ගිණුම්කරණය
- කළමනාකරණ ගිණුම්කරණය


ගිණුම්කරණ ඒකකය අතීත ගනුදෙනු හා සිද්ධීන්වලට අදාළ තොරතුරු ආර්ථිකමය තීරණ ගැනීමට සුදුසු වන ආකාරයට සකස් කර, බාහිර පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය ගිණුම්කරණයයි.

ආයතනයක සියලුම කළමනාකරණ මට්ටම්වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම, පාලනය කිරීම, තීරණ ගැනීම, වගකීම් ඉටු කිරීමට හැකි වන සේ මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම කළමනාකරණ ගිණුම්කරණයයි.

# මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය




# කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය




ClassWork.LK

# මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම්

| මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|
| 1. ඓතිහාසික තොරතුරු පමණක් යොදා ගනියි. | 1. ඓතිහාසික හා පුරෝකථන තොරතුරු යොදා ගනියි. |
| 2. බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන්ට තොරතුරු ඉදිරිපත් කරයි. | 2. අභ්‍යන්තර පාර්ශ්වයන්ට පමණක් තොරතුරු ඉදිරිපත් කරයි. |
| 3. ගිණුම්කරණ කාලච්ඡේදයක් සඳහා තොරතුරු ඉදිරිපත් කරයි. | 3. කළමනාකරණයට අවශ්‍ය වන අවස්ථාවන්හි තොරතුරු ඉදිරිපත් කරයි. |
| 4. ගිණුම්කරණ සංකල්ප, නීති රීති සම්ප්‍රදායයන් ගිණුම්කරණ ප්‍රමිති යොදා ගනියි. | 4. ගිණුම්කරණ සංකල්ප, නීති රීති, ගිණුම්කරණ ප්‍රමිති අදාළ නොවේ. |

ClassWork.LK



2022
ADVANCED
LEVEL
පළමු මස
නොමිලේ...
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura